**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) - 2023**

**-------------------------------------------------------------------**

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 නොවැම්බර් 05 දින එළඹී අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, 2015 මැයි 28 දින එළඹී අංක 3221 එස්ආර්අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම්, 2015 දෙසැම්බර් 11 දින එළැඹී අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම්, 2017 දෙසැම්බර් 15 දින එළඹී අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො. මිලියන 906 ක් වන අතර ඉන් රු. මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 13,780 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2014 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | අයි-මාර්ග II අරමුදල් හරහා අන්තර් ගෙවීම් සහතික සඳහා ගෙවීම් පිළිවෙලින් අන්තර් ජංගම ගිණුමට සහ රඳවා ගැනීමේ ගිණුමට බැර කළ යුතු වුවද, පැකේජ අංක. ආර්එම්සි /05-C හි අතුරු ගෙවීම් සහතික අංක-26 සඳහා ගෙවූ රු. මිලියන 20.42 ක් | 14.58 | ආර්එම්සි/05-C කොන්ත්‍රාත් පැකේජයේ අතුරු ගෙවීම් සහතික අංක 26 දරන කොන්ත්‍රාත් ගෙවීම නිවැරදිව සටහන් කර තිබුණි. කෙසේ වුවද , එම අතුරු ගෙවීම් සඳහා JE/23/216 මගින් | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් දැක්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | වැරදි ලෙස රඳවා ගැනීමේ ගිණුමට බැර කර තිබුණි. එමගින් රඳවා ගැනීමේ වගකීම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | අතිරේක සටහනක් ඇතුලත්වී ඇති අතර එය නැවත ගැලපුම් කිරීම 2024 දී සිදු කෙරේ. | |
| (ආ) | ආර්එම්සි/01 ඩි පැකේජයෙහි රු. මිලියන 4.16 ක් වූ අයකරගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වැරදි ලෙස රඳවා ගැනීම් ගිණුම බැර කර තිබුණි. එමනිසා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ රඳවා ගැනීම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 4.16 | මෙම වැරදි සටහන අංකන දෝෂයක් මත සිදුව ඇත. එමනිසා එය 2024 දී නිවැරදි කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් දැක්විය යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 3.5 අනුව, අවලංගු කරන ලද කොන්ත්‍රාත්කරුවන් 12 දෙනෙකුගෙන් ලැබිය යුතු කාර්යය සාධන ඇපකර මුදල රු. මිලියන 2,668.47 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අදාළ මුදල රු. මිලියන 2,618.47 ක් ලෙස වැඩසටහන මගින් තහවුරු කර තිබුණි. එබැවින් විගණනයේදී නොසැසදුනු ශේෂයක් නිරීක්ෂණය විය. | 50.00 | 2023.12.31 දිනට අවලංගු කරන ලද කොන්ත්‍රාත්කරුවන් 12 දෙනෙකුට අදාළ කාර්ය සාධන ඇපකර වටිනාකම රු. මිලියන 2618.41 ක් වුවත් එය මූල්‍ය පුකාශන සටහන් වල රු. මිලියන 2,668.47 ක් ලෙස සවදා ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම පෙන්විය යුතුය. |
| (ඈ) | RMC 06-B පැකේජයට අදාළ රඳවා ගැනීමේ මුදල රඳවා ගැනීමේ ගිණුමේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එමනිසා, ජංගම වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 13.15 | ආර්එම්සි /06-බි කොන්ත්‍රාත් පැකේජයේ දෙවරක් සටහන් වූ රඳවා ගැනීමේ ගිණුමේ ඇති රු. මිලියන 13.15 ක මුදල 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම පෙන්විය යුතුය. |
| (ඉ) | ආරවුල් බේරුම්කරණය සඳහා වූ රු. මිලියන 3,176.90 ක වගකීම, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ සඳහා ගෙවීම් පිළිබඳ විස්තර සහ අවලංගු කරන ලද කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට සත්‍යාපනය කළ නොහැකි විය. | 3,176.90 | පවතින සීමිත කාර්ය මණ්ඩලය සමඟ විස්තර එකතු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඉල්ලීම් කරන ලද තොරතුරු නියමිත වේලාවට විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | එක් එක් බේරුම්කරණ කටයුතු සහ සියලුම කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සඳහා වෙන වෙනම ලිපිගොනු සහ ලේඛන පවත්වාගෙන යා යුතු අතර, බේරුම් කරන කටයුතු විසඳෙන තෙක් සියළුම කොන්ත්‍රාත් පරිපාලන ලේඛණ තබා ගත යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි 108.4 උප වගන්තිය | කොන්ත්‍රාත් කොන්දේසි 108.4 උප වගන්තිය ප්‍රකාරව සියලුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ වැඩසටහන අවසානයේ කොන්ත්‍රාත්කරු වෙතම ආපසු ලබා දෙන නමුත්, 2022 දක්වා රසායනාගාර, ගෘහ භාණ්ඩ සඳහා එකවර රු. මිලියන 397.77 ක මුදලක් ගෙවා තිබුණු අතර මිනින්දෝරු උපකරණ සහ සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සත්‍යාපනය කළ නොහැකි විය. මේ අනුව වාසිදායක කොන්ත්‍රාත්තු කොන්දේසි නිසා කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ අත්විය හැකි බව මෙමගින් පෙන්නුම් කෙරිණි. | නිෂ්පාදන සහතිකය සහ ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත පදනම්ව කොන්ත්‍රාත්කරුවන්ට භාවිතා කරන ලද රසායනාගාර උපකරණ භාවිතා කිරීමට ඉඩ දී තිබුණි. මා.සං.අ. සතුව රසායනාගාර උපකරණ දැනට ප්‍රමාණවත් තරම් ඇති අතර එවැනි උපකරණ ගබඩා කිරීම සඳහා ඉඩකඩ ද නොමැත. තවද, වසර 3 ක් භාවිතා කිරීමෙන් සහ ක්ෂය වීමෙන් පසු උපකරණවල වටිනාකම ඉතා අඩු අගයක් වනු ඇත. | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි බලාත්මක කිරීමට පෙර ප්‍රවේශමෙන් සමාලෝචනය කළ යුතුය. සේවා යෝජකයාගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, මුදලට අගය තබා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම වැළැක්වීම සඳහා ලංසු ලේඛන සමාලෝචනය කිරීමේදී තාක්ෂණික හා ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | අවම වශයෙන් මාස දෙකකට වරක්වත් ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටුව රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ එක් රැස්වීමක් පමණි. | මෙම කාලය තුළ වැඩ කටයුතු අත්හිටුවා ඇති බැවින්, සාමාන්‍ය පරිදි රැස්වීම් කැඳවනු නොලැබේ. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |
| (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02.i ඡේදය | ලියාපදිංචි හිමිකාරිත්වය නොමැතිව භාවිතා කරන වාහන, අදාළ ලියාපදිංචි හිමිකරු වෙත භාර දිය යුතු හෝ ලියාපදිංචි හිමිකරුගේ කැමැත්ත ඇතිව ලියාපදිංචි අයිතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, වැඩසටහන මගින් මා.සං.අ. වෙත භාරදී ඇති වාහන අතරින් වාහන 13 ක් නිසි හිමිකාරීත්වයක් නොමැතිව වෙනත් ආයතන විසින් භාවිත කර තිබුණි. එබැවින් වැඩසටහන අවසන් වීමට පෙර වාහනද භාරදීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | මා.සං.අධි. විසින් එම වාහන වෙනත් රාජ්‍ය ආයතන වෙත ඔවුන්ගෙන් ලැබුණු විධිමත් ඉල්ලීම් මත මුදා හරිනු ලැබේ. අමාත්‍යාංශයේ භාවිතය සඳහා මා.සං.අ. වෙතින් වාහන 05 තාවකාලිකව මාරු කරන ලදී. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු එම වාහනවල අයිතිය නිසි පරිදි පැවරීමට කටයුතු කරනු ඇත. | වාහන මිලදී ගත් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී. | ලඟාකරගත් කාර්යසාධනය කි.මී. | | |
| ජාතික සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කණ කටයුතු සම්පූර්ණ කිරීම | ජාතික සහ ග්‍රාමීය මාර්ග | කි.මී. 3,275 | කි.මී. 2,990 | 2023 දෙසැම්බර් 31 දිනට වසර 09 ක් ගතවීමෙන් පසුවද ජාතික මාර්ග දිග කි.මී.370 කින් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,905 ක් අතුරින් ජාතික මාර්ග කි.මී. 165 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,825 ක් පමණක් නිම කර තිබුණි. | බොහෝ කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ වැඩ අත්හිටුවීම, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, කොන්ත්‍රාත් ගෙවීම් ප්‍රමාදය ප්‍රධාන වශයෙන් දුර්වල ප්‍රගතියට බලපා තිබුණි. |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

අතුරු ගෙවීම් සතික ගෙවීමේ අවිනිශ්විතතාවය හේතුවෙන් සමහර කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ වැඩ අත්හිටුවා ඇත. සමහර කොන්ත්‍රාත්කරුවන් දුර්වල කාර්ය සාධනය් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, රජයේ ණය ගැනීම් සීමා කිරීම හේතුවෙන්, සම්පූර්ණ විෂය පථය ආවරණය කිරීමට නොහැකි වනු ඇත.

**විගණකගේ නිර්දේශය**

කාල රාමුව තුල ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට පළාත් 05 ක කොන්ත්‍රාත් පැකේජ 12 ක් සේවායෝජක සහ කොන්ත්‍රාත්කරු විසින් අවලංගු කර ඇති අතර, ලබාදී තිබුණු වූ රු. මිලියන 2,793.41 ක අත්තිකාරම් මුදල් 2023 දෙසැම්බර් 31 දින වනවිට එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්තු අටක් (8) සඳහා වාරණ නියෝග හේතුවෙන් රඳවා ගත් අත්තිකාරම් ගෙවීම අත්හිටුවා ඇත | අත්තිකාරම් ඇපකර මුදල් කර අයකර ගැනීම් සිදුකිරීමට හෝ පාඩු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අදාළ ඇපකර මුදල්කර ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් රු. මිලියන 2,668.47 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කොන්ත්‍රාත්කරුවන් විසින් එම ප්‍රමාදයන් ඇප මුදල් අය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාවක් කරගෙන තිබුණි. | වාරණ නියෝග හේතුවෙන් කාර්ය සාධන ඇපකර මුදල් කරගැනීම ඇණහිට තිබුණි. | ඇපකර මුදල් කර අයකර ගැනීම් සිදුකිරීමට හෝ පාඩු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් ගෙවීම ප්‍රමාදවීම හා ඉතිරි මාර්ග පුනරුත්ථාපන කටයුතු වල විෂය පථය සීමා කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6250.03 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතව පැවතුණි. | පවතින කොන්ත්‍රාත් බොහොමයක අරමුදල් සීමා කිරීම් හේතුවෙන් විෂය පථය සීමා කර ඇත. එබැවින්, සැලසුම් කළ පරිදි අත්තිකාරම් ආපසු ලබා ගත නොහැක.<br>කොන්ත්‍රාත්කරුවන්ගේ කැමැත්ත ඇතිව රැඳවුම් මුදල් හා හිඟ හිට ඇති අතුරු ගෙවීම් සහතික හිලව් කිරීම මගින් අත්තිකාරම් අයකර ගැනීමේ යාන්ත්‍රණයක් සැකසීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් සිදු කෙරුණි. | නැවත සැලසුම් කිරීමේ බලපෑම තහවුරු කර ගත යුතු අතර, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වෙනස් කිරීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 14.7 උප වගන්තියට අනුව සේවා යෝජකයා විසින්, එක් එක් අතුරු ගෙවීම් සහතිකයේහි සහතික කළ මුදල දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල රු. මිලියන 2,671.28 ක් බව නිරීක්ෂණය විය. තවද, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසියේ 14.8 උප වගන්තියට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද පොලිය සඳහා රු. මිලියන 284.77 ක වෙන් කිරීම් සිදුකර තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමේ ප්‍රමාදයන් රජයට අතිරේක පිරිවැයක් සහ වැය බරක් වනු ඇත. | 2023 මුල් භාගයේදී වැඩ අත්හිටුවා ඇති අතර ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම හේතුවෙන් අතුරු ගෙවීම් සහතික ගෙවීම් කිහිපයක් අත්හිටුවා ඇත. කෙසේ වෙතත්, අයි මාර්ග 2 වැඩසටහනේ ණය වාරික 4 ලැබීමෙන් පසු, සියලුම අතුරු ගෙවීම් සහතික පියවා ඇත. එහෙත්, ප්‍රමාද වූ ගෙවීම් සඳහා පොලී ගෙවීම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව ගෙවිය යුතුය. | ප්‍රමාද පොලී අවම කිරීමට පියවර ගත යුතු අතර හිමිකම්වල නිරවද්‍යතාවය සහතික කළ යුතුය. |

### 3.3 වාහන උපයෝජනය

සපයා ඇති තොරතුරුවලට අනුව, වැඩසටහන මගින් රු. මිලියන 1,499.58 ක් වැය කර යතුරුපැදි 168 ක් ඇතුළුව මෝටර් රථ 335 ක් මිලදී ගෙන ඇති අතර, එම වාහනවලින් බොහොමයක් මේ වන විටත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. විගණනයට සපයා ඇති තොරතුරුවලට අනුව දැනට මෝටර් රථ 08 ක් සහ යතුරුපැදි 09 ක් අයි මාර්ග වැඩසටහනට වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කේඑල්-01 කොන්ත්‍රාත් පැකේජය යටතේ රු. මිලියන 7.47 ක වියදමින් මිලදී ගත් ඩබල් කැබ් රථය අදාළ පැකේජයේ මාර්ග ප්‍රතිසංස්කරණය අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට පෙර 2019 දෙසැම්බර් 07 දින අනතුරට ලක්ව තිබුණි. වාහන අලුත්වැඩියාකරු විසින් රු. මිලියන 6.93 ක ඇස්තමේන්තුවක් ලබාදී තිබුණු අතර රක්ෂණකරු විසින් දරන ලද වියදම රු. මිලියන 4.00 ක් පමණක් විය. එමනිසා රු. මිලියන 2.93 ක ඉතිරි මුදල අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ග විගණනයට අනාවරනය නොවිණි. | කොන්ත්‍රාත්කරු සහ වාහන අළුත්වැඩියාකරු අතර 2024 මාර්තු 28 වන දින පැවති රැස්වීමකදී අලුත්වැඩියාකරු මාස 04 ක කාලයක් තුළ අලුත්වැඩියාව අවසන් කිරීමට එකඟ වී ඇත. | පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 104 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමේ අවසන් විමර්ශන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පවත්වා මූලික වාර්තාව ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුගත වියයුතු අතර ප්‍රමාදය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඇ) | මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට පෙර වැඩසටහන විසින්ම මිලදී ගත් වාහන 335 න් 318 ක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත. එමනිසා, මෙම වැඩසටහන මගින් වසර තුළදී ව්‍යාපෘති කළමණාකරන ඒකකය සහ පළාත් කාර්යාල භාවිතය සඳහා වාහන 14 ක් කුලී පදනමට ගැනීමට තීරණය කර තිබුණු අතර එම වාහන සඳහා කුලිය වශයෙන් 2023 දෙසැම්බර් 15 දිනට රු. මිලියන 16.36 ක මුදලක් ගෙවා තිබුණි. එබැවින් ණය නියෝජිතායතනයෙන් අත්‍යාවශ්‍ය වැඩ සඳහා ලැබෙන අරමුදල් සඳහා එය අමතර වැය බරක් විය හැක. | ඉහත ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ප්‍රමාණවත් තරම් මා.සං.අ. වාහන නොතිබුණු බැවින්, පළාත්වල වැඩ සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් වාහන දාහතරක් (14) කුලියට ගන්නා ලදී. | වත්කම් අවභාවිතය සහ අවිධිමත් කළමනාකරණය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා විමර්ශන පැවැත්විය යුතුය. |

**3.4 පරිබාහිර ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහන විසින් වියපැහැදම් නොවූ අරමුදල් මත සමුච්චිත බැඳීම් ගාස්තු ලෙස එ.ජ.ඩො. මිලියන 1.4 කට සමාන රු.මිලියන 248.27 ක් අනාර්ථිකව ණය නියෝජිත ආයතනය වෙත ගෙවා තිබුණි. | ණය ගිවිසුමේ කොන්දේසි අනුව වියපැහැදම් සඳහා සූදානම් කළ ණය ප්‍රයෝජනයට නොගත් ප්‍රමාණයෙන් සියයට 0.15 ක බැඳීම් ගාස්තුවක් අය කෙරේ. | ණය අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 ඌන උපයොජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාමාන්‍යයෙන්, මුළු ණය මුදල වන එ.ජ.ඩො. මිලියන 800 ක් බහු මූල්‍ය පහසුකම යටතේ අදියර කිහිපයක් මඟින් වරින් වර ණය ප්‍රදානකරු විසින් නිදහස් කරනු ලැබේ. 2023 දෙසැම්බර් 31 දිනට පෙර ණය ප්‍රදානකරු විසින් ඔවුන්ගේ නිත්‍ය නිකුත්කිරීමේ ක්‍රමයට (regular disbursement method) එ.ජ.ඩො. මිලියන 557 ක් අදියර හතරක් යටතේ නිදහස් කර තිබුණි. කෙසේවුවද, සාර්ව ආර්ථික අර්බුදය හේතුවෙන් ක්‍රියාවලිය අත්හිටුවන ලදී. පසුව, අසම්පූර්ණ මාර්ග කොටස් හා මේ වන විටත් ආරම්භ කර ඇති අත්‍යවශ්‍ය වැඩ ඉටුකිරීමට, ආරම්භ නොකරන ලද මාර්ගවල නඩත්තු කිරීම් සහ අයිමාර්ග හා දෙවන අයිමාර්ග වැඩසටහන්වල පූර්ව වැඩ නිම කිරීම් සඳහා ගෙවීම් කිරීමට වැඩසටහනේ 04 වන අදියර යටතේ එ.ජ.ඩො. මිලියන 60 ක් තවදුරටත් සැපයීමට තීරණය කර තිබුණි. වැඩසටහනේ අදියර 01 සිට 04 සඳහා ණය ගිවිසුම අත්සන් කර වර්ෂ 09 ක් ගතවූ පසු එකඟ වූ ණය වටිනාකම වන රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 න් රු.මිලියන 97,178.01 කට සමාන එ.ජ.ඩො. මිලියන 543.67 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි. තවද, අයිමාර්ග II වැඩසටහනෙහි අදියර 4 යටතේ ලද අරමුදල්වලින් රු.මිලියන 1,376.64 ක් සිවිල් වැඩ සඳහා වියදම් කර තිබුණි. | මෙම වැඩසටහන වර්ෂ 10 ක ක්‍රියාත්මක කිරීමේ කාලයක් සහිත බහු අදියර මූල්‍ය පහසුකමකි. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස රජයේ ණය ගැනීම් සීමාවීම හේතුවෙන් ඉතිරි මුදල වූ එ.ජ.ඩො. මිලියන 243 ලැබීම අවිනිශ්චිත වේ. මෑතකදී අනුමත කරන ලද අයිමාර්ග II හි අදියර 4 හි, අයිමාර්ග I හා අයිමාර්ග II වැඩසටහන්වල වියදම් සඳහා ප්‍රතිපාදන ඇත. ඒ අනුව ගෙවීම් සිදු කර ඇත. | විෂය පථය සීමාකිරීම් මත වූ ප්‍රතිපාදන සඳහා හඳුනාගත් ක්කර්යයන් පදනම් කරගෙන නිසි ක්‍රියාකාරී සැලැසමක් සකස් කර අනුමත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 22,020 ක මුදලක් වෙන් කර තිබුණද, සත්‍ය වියදම රු. මිලියන 5,768.78 ක් විය. එබැවින් 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු. මිලියන 16,251.22 ක් විය. | 2023 සඳහා අයවැය ඇස්තමේන්තුව සකස් කර තිබුණද, ඊළඟ ණය වාරික මුදල ලැබෙන තුරු තාවකාලිකව වැඩ අත්හිටුවන ලෙස කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දී ඇත. දෙවන අයිමාර්ග ව්‍යාපෘතියේ 4 වන ණය වාරික මුදල 2023 දෙසැම්බර් 03 දින සිට ක්‍රියාත්මක විය. එබැවින් සැබෑ වියදම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු විය. | ප්‍රතිපාදන සංශෝධනය කිරීමට ක්‍රියා කළ යුතු අතර ප්‍රමාදයකින් තොරව ප්‍රතිඵල ලඟා කරගැනීම කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 මතභේදයට තුඩුදෙන කරුණු

2022 වර්ෂයේ ආර්.එම්.සී.04 පැකේජයෙහි පැල්මඩුල්ල-ඇඹිලිපිටිය-නෝනාගම මාර්ගයේ විචලනයන් යටතේ 2022 බලංගොඩ- බෝවත්ත- කල්තොට මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම මාර්ගයේ මුළු දිග කි.මී.16 ක් වූ අතර පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත් පිරිනමා තිබුණු කොන්ත්‍රාත්කරුවන් 04 දෙනා වෙතම පිරිනමා තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණය නියෝජිතයාතනයේ එකඟතාවයට සහ ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට යටත්ව මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මෙම පුනරුත්ථාපන කටයුතු අනුමත කර තිබුණද, එම එකඟතා විගණනයට හෙළි නොවූ අතර අදාළ ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය නොකර ඉදිකිරීම් ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම මාර්ගය මුලදී හඳුනාගෙන අයි මාර්ග වැඩසටහනේ RMC කොන්ත්‍රාත් යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කර තිබුණි. ඒ අනුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ඇතිව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) නිර්දේශය ඇතිව අයිමාර්ග වැඩසටහන යටතේ ඇතුළත් කිරීමට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ කොන්දේසි පිළිපැදිය යුතු අතර මාර්ගෝපදේශයට අනුකූල නොවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ආ) | තවද, අයි මාර්ග වැඩසටහනේ මූලික වැඩ සැලැස්මට පටහැනිව කුරගල විහාරස්ථානයේ ජාතික වෙසක් උත්සවය නිමිත්තෙන් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර තිබුණි. | ආ.සං.බැ. එකඟතාව ලබා ගන්නා ලදී. ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ලංසු කැඳවීම සඳහා ලියකියවිලි අවසන් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. කෙසේ වෙතත් ජාතික වෙසක් | වැඩසටහනේ විෂය පථය තුළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගිවිසුම්ගත කාලසීමාව තුළ කොන්ත්‍රාත්කරුවන් 04 දෙනාගෙන් දෙදෙනෙකු සිවිල් වැඩ අවසන් කර ඇති බවත් ඉතිරි කොන්ත්‍රාත්තු දෙකෙහි ඉදිකිරීම් කටයුතු 2023 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ නොකර ඉතිරිව ඇති බවත් දන්වන ලදී. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද ගෙවීම් ප්‍රමාණය සහ ගෙවීම සඳහා අනුමැතිය විගණනයට හෙළි නොවිනි. | උත්සවය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් මෙම මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අත්‍යාවශ්‍ය විය.එම නිසා මෙම මාර්ග කොටස ආසන්නයේ සේවය කරන ආර්.එම්.සී./04 කොන්ත්‍රාත්කරුවන්ට විචලන නියෝග නිකුත් කර එම කටයුතු සිදු කරන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂකට උපදෙස් දෙන ලදී. ඒ අනුව වැඩ අවසන් කිරීමට මාස 4 -5 ක කාලයක් පමණක් ඇති බැවින් එම | ප්‍රමාදයකින් තොරව සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවන ලද ගෙවීම් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ඉ) | විගණනයට සපයා ඇති විස්තර අනුව, අමාත්‍යාංශය මගින් මූලික පරීක්ෂණයක් පවත්වා අදාළ වාර්තාව අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) විසින් 2023 නොවැම්බර් 30 දින ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම විමර්ශනයෙන් පසු ගන්නා ලද ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාක්ෂි අනාවරණය නොවීය. | කටයුතු කඩිනමින් සිදු කරන ලෙස කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දෙන ලදී. මේ අතර ණය මුදල් ප්‍රමාණවත් නොවීම මත වැඩකටයුතු අත්හිටුවන ලදී. කෙසේ වෙතත් මෙය වහාම විධිමත් කළ යුතු වේ. | කිසිදු ප්‍රමාදයකින් තොරව විමර්ශන සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු අතර වගකිව යුතු පාර්ශව හඳුනා ගත යුතුය. |